# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

1971 වර්ෂය සඳහා වන මහ බැංකුවේ මූල්‍ය ගිණුම 11 වැනි පරිශිෂ්ඨයේ 19 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. 1970 වර්ෂය හා අවසානයේදී දක්නට ලැබුණු ප්‍රධාන වෙනස් කම් මෙසේය:

| | වෙනස (රුපියල් දශලක්ෂ) |
|---|---|
| මූළ ඉල්ලුම් වගකීම් .. .. .. | + 15·4 |
| ව්‍යවහාර මුදල් සංසරණය .. .. .. | + 194·7 |
| ඉල්ලුම් තැන්පතු .. .. .. | − 101·6 |
| පිටරට ණය ගැනීම් .. .. .. | − 77·7 |
| ජාත්‍යන්තර සංචිතය .. .. .. | + 44·2 |
| දේශීය වත්කම් .. .. .. | + 61·0 |

\+ වැඩිවීම
− අඩුවීම

වර්ෂය තුළදී රන් පවුම්, ඉන්දියානු රුපියල් සහ එක්සත් ජනපද ඩොලර් සඳහා වූ මහ බැංකු විනිමය අනුපාතික ප්‍රතිශෝධනය කරන ලදී. වර්ෂය අවසානයේදී වූ අනුපාතිකයන් මෙසේය:—

| | | විදුලිය පැවරුම් මගින් මිලයට ගැනීම් | විදුලිය පැවරුම් මගින් විකිණීම් |
|---|---|---|---|
| රන් පවුම (සියයකට) | තැන් ඉදිරි (සමස දක්වා) | රුපියල් 1516 3/8 මසකට තැන් මිලෙන් රුපියලකට 21/32 ක් වට්ටම් කොට. | රුපියල් 1517 7/8 මසකට තැන් මිලෙන් රුපියලකට 21/32 ක අධි මිළක් ඇතිව. |
| ඉන්දියානු රුපියල් (සියයකට) | තැන් ඉදිරි (සමස දක්වා) | රුපියල් 79 23/32 මසකට තැන් මිලෙන් රුපියලකට 1/32 ක් වට්ටම් කොට. | රුපියල් 79 25/32 මසකට තැන් මිලෙන් රුපියලකට 1/32 ක අධි මිලක් ඇතිව. |
| එක්සත් ජනපද ඩොලර් (සියයකට) | තැන් ඉදිරි (තෙමස දක්වා)* | රුපියල් 595·25 මසකට තැන් මිලෙන් රුපියලකට ශත 50 ක් වට්ටම් කොට. | රුපියල් 595·50 මසකට තැන් මිලෙන් රුපියලකින් ශත 50 ක අධි මිළක් ඇතිව. |

* තෙමසකට වැඩි හා සමස දක්වා වන කාලසීමාවන් සඳහා මහ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලබන විශේෂ ඉල්ලීමක් පිට.

මහ බැංකුවේ විදේශ විනිමය ගනුදෙනු II වැනි පරිශිෂ්ඨයේ 24 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

වාණිජ සහ නිෂ්පාදන ණය වලට සම්බන්ධ රජයේ සුරැකුම් පත් සහ භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා ගෙන දෙනු ලබන අත්තිකාරම් සඳහා වන මහ බැංකු පොළී අනුපාතිකය තවදුරටත් වසරකට සියයට 6½ ක් වම පැවතුණි. සහතික මිල ක්‍රමය යටතේ වී මිලයට ගැනීමට හා මෙරට නිෂ්පාදිත කෘෂිකාර්මික ද්‍රව්‍ය මිලට ගැනීම, විකිණීම හෝ ගබඩා කිරීම සඳහා මුදල් සැපයීම් වශයෙන් භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා ගෙන සමුපකාර සමිති වලට දෙන ලද අත්තිකාරම් සඳහා මහ බැංකුව වෙළෙඳ බැංකු වලින් අයකරන පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 3 ක්ව තවදුරටත් පැවතිණි. වී, ඇනු, මිරිස්, අර්තාපල්, අන්නාසි සහ එළවළු නිෂ්පාදනය සඳහා සමුපකාර සමිතිවල භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා ගෙන මහ බැංකුව විසින් වෙළෙඳ බැංකු වලට දෙන ලද අත්තිකාරම් සඳහා වූ පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 1½ ක්ව නොවෙනස්ව පැවතිණි. එසේ වුවද, මෙම අනුග්‍රහය ලබන වෙළෙඳ බැංකුවලට එකී පොරොන්දු නෝට්ටු නිකුත් කළ අයගෙන් වර්ෂයකට

සියයට 8 කට (නියමිත දින බේරුම් කළහොත් වර්ෂයකට සියයට 3 ක ප්‍රතිදානයකට යටත්ව) වඩා වැඩි පොළියක් අය කිරීමට නොහැකි විය. භාණ්ඩාගාර බිල්පත් සඳහා වන මහ බැංකුවේ වට්ටම් අනුපාතිකය අන්තිම වරට පිළිගත් සාමාන්‍ය ටෙන්ඩර් අනුපාතිකයට වඩා සියයට ⅛ කින් වැඩිව තවදුරටත් පැවතිණි.

**විදේශීය මුදල් නෝට්ටු**

ලංකාවේ කටයුතු කරන වෙළෙඳ බැංකු වලින් නියමිත විනිමය අනුපාතිකයන් අනුව විශේෂිත විදේශීය මුදල් නෝට්ටු මිලදී ගැනීම මහ බැංකුව විසින් තවදුරටත් කර ගෙන යන ලදී. 1971 දෙසැම්බර් 28 වැනි දින සිට විශේෂිත විදේශීය මුදල් නෝට්ටු, වෙළෙඳ බැංකු වලට නියමිත විනිමය අනුපාතිකයන් අනුව විකිණීමටද මහ බැංකුව ඉදිරිපත් විය.

**ණය සඳහා ඇපවීමේ ක්‍රමය**

වී, එළු, මිරිස්, අර්තාපල්, අන්නාසි, එළවළු සහ තුනපහ භෝග වගාව සඳහා වෙළෙඳ බැංකු වලින් සමුපකාර සමිති වලට දෙනු ලැබ ආපසු ගෙවීම් පැහැර හරිනු ලබන ණය වෙනුවෙන් එසේ පැහැර හැර ඇති ණය ප්‍රමාණයෙන් සියයට 75 ක් දක්වා වන ප්‍රමාණයක් රජය වෙනුවෙන් එම බැංකුවලට ගෙවීමට මෙම ක්‍රමය යටතේ මහ බැංකුව ඇප වී ඇත. වෙළෙඳ බැංකු විසින් ඇප ගාස්තු වශයෙන් සියයට එකකින් අඩක් වූ ප්‍රමාණයක් ගෙවිය යුතුය. 1971 දී වෙළෙඳ බැංකු විසින් දෙන ලද රුපියල් 4,19,76,000 ක ණය සඳහා මහ බැංකුව ඇප වී ඇත.

**මැදි හා දිගු කාලීන ණය**

වර්ෂය තුළදී මුළු වශයෙන් රුපියල් 1,79,93,000 ක ප්‍රතිමූල්‍ය ණය, ණය දෙන ආයතන වලට දී ඇත. මහ බැංකුව විසින් ණය දෙන ආයතන වලට දෙනු ලබන ප්‍රතිමූල්‍ය ණය සඳහා අය කෙරෙන පොළී අනුපාතිකයන් පහත දක්වෙන පරිදි 1971 ජනවාරි 30 වැනි දින සිට බල පැවැත්වෙන අයුරින් ප්‍රතිශෝධනය කොට ඇත.

(අ) කෘෂිකර්මාන්ත හෝ කර්මාන්ත නැංවීම හෝ සංවර්ධනය හෝ සඳහා දෙනු ලබන ණය-වර්ෂයකට සියයට 6½

(ආ) තේ කම්හල් නවීකරණය කිරීම සඳහා හා නව කම්හල් ඉදි කිරීම සඳහා තේ පාලක ණය මුදල සඳහා වන පොළියෙන් කොටසක් ගෙවන අවස්ථාවන්හිදී-

(i) ප්‍රතිමූල්‍ය ණය වෙනුවෙන් මෙරට වියදම් පියවා ගැනීම සඳහා සියයට 6 ක වාර්ෂික පොළියක්;

(ii) ප්‍රතිමූල්‍ය ණය වෙනුවෙන් විදේශ විනිමය වියදම් පියවා ගැනීම සඳහා සියයට 8 ක වාර්ෂික පොළියක්.

(ඇ) වෙළෙඳ, වාණිජ හෝ ව්‍යාපාර කටයුතු නැංවීම හෝ සංවර්ධනය සඳහා වර්ෂයකට සියයට 7½ ක පොළියක්.

**මුදල් නිකුතුව**

1971 අවසානයේදී සංසරණය වූ මුළු මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,285·1 ක්වූ අතර එය 1970 අවසානයේ සංඛ්‍යාව හා සසඳන කල රුපියල් දශලක්ෂ 194·7 ක වැඩිවීමක් විය. සංසරණයෙහි පැවති නෝට්ටු වල රුපියල් දශලක්ෂ 188·0 ක වැඩිවීමක් සහ සංසරණයෙහි පැවති කාසි වල රුපියල් දශලක්ෂ 6·7 ක වැඩිවීමක් සිදුවී ඇත. සංසරණයෙහි පැවති නෝට්ටු වල වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ රුපියල් 100 වටිනාකමක් දරන නෝට්ටු රුපියල් දශලක්ෂ 169·1 කින්ද, රුපියල් 50 වටිනාකම දරන නෝට්ටු රුපියල් දශලක්ෂ 51·9 කින් ද, රුපියල් 10 වටිනාකම දරන නෝට්ටු රුපියල් දශලක්ෂ 31·0 කින්ද, වැඩිවීමය. සංසරණයෙහි පවත්නා කාසිවල වැඩිවීමට හේතු වූයේ සැම වර්ගයකම කාසිවල සංසරණය ක්‍රමිකව වැඩිවීමය.

වර්ෂය තුළදී අළුත් නෝට්ටු හෝ කාසි නිකුතුවක් සිදුවී නොමැත.

**බැංකු හර බද්ද**

බැංකු හර බද්ද එකතු කිරීම පරිපාලනය කිරීම මහ බැංකුව විසින් තවදුරටත් කරන ලදී.

**අනිවාර්ය ඉතිරි කිරීම**

අනිවාර්ය ඉතිරි කිරීම් වලින් ලැබෙන මුදල් වල භාරකරු වශයෙන් මහ බැංකුව ක්‍රියාකළ අතර රජය වෙනුවෙන් එම අරමුදල පරිපාලනය කිරීමද කරන ලදී.

**විදේශ විනිමය සහතික පත් ක්‍රමය**

රජය වෙනුවෙන් විදේශීය විනිමය සහතික පත් ක්‍රමය පරිපාලනය කිරීම මහ බැංකුව විසින් තවදුරටත් කරන ලදී.

**ආදයම සහ වියදම**

වර්ෂය සඳහා මහ බැංකුවේ ආදයම රුපියල් 8,30,86, 000 ක් වූ අතර, සංචිත සඳහා වෙන්කිරීම් සහ ගොඩනැගිල්ලේ වටිනාකම ක්ෂයවීම සඳහා වූ ප්‍රතිපාදනයද ඇතුළත්ව වියදම රුපියල් 8,20,86,000 ක් විය. මුදල් නීති පනතේ 39 (ආ) වගන්තියට අනුව ශුද්ධ වූ ලාභය වූ රුපියල් 10,00,000 අතිරික්තයට එකතු කරන ලදී.

**බැංකු පරිපාලනය**

මුදල් නීති පනතේ 29 (1) වැනි වගන්තිය යටතේ බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව 1971 වර්ෂයේදී වාණිජ බැංකු පහක් පරීක්ෂා කළ අතර, කලින් පටන් ගන්නා ලද තවත් වෙළෙඳ බැංකු දෙකක පරීක්ෂණ කටයුතු අවසන් කර, මුදල් නීති පනතේ 127 (1) (ඇ) වගන්තිය යටතේ බැංකු ආයතන වශයෙන් ප්‍රකාශයට පත් කැරුන සමුපකාර බැංකු පහක් පරීක්ෂා කළාය.

1968 අංක 36 දරන පනතින් සංශෝධිත පරිදි 1961 අංක 65 දරන මුදල් පනතේ 111 වන කොටසෙහි ක්‍රියාවලිය හා සම්බන්ධ කාර්යයන් දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් කරගෙන යන ලදී.

සංවර්ධන මූල්‍ය අංශය, ආසියානු සංවර්ධන බැංකුව විසින් තේ කර්මාන්ත ශාලා නවීකරණ යෝජනා ක්‍රම සඳහා මහ බැංකුව වෙත ලබා දෙන ලද පළමු හා දෙවන ණය මුදල් මාලාවන් මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය කිරීමට පෙර අගැයීමෙහි තවදුරටත් නිරත විය. මහ බැංකුව විසින් පිහිටුවනු ලැබූ මැදි හා දිගුකාලීන ණය අරමුදලෙන්, කර්මාන්ත, කෘෂිකර්මාන්ත සහ වාණිජ කටයුතු සඳහා දෙන ලද අනෙකුත් ප්‍රතිමූල්‍ය ණය මුදල්ද අංශය විසින් අගයන ලදී.

1970 අංක 27 දරන බැංකු හර බදු පනත මගින් මහ බැංකුව වෙත පැවරුණු වගකීම් හා සම්බන්ධ කාර්යයන්ද දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී.